" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/04 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.11.14 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ ලිපි අංක: **03/2023**

**ඉතා වැදගත්**

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම් (බ.ප.),

ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),

අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

<u>බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත විවිධ පද්ධති, භාණ්ඩ, උපකරණ හා සවිකිරීම් ඇතුලු උපාංග යථාවත් පරිදි පවත්වාගෙන යාම සම්බන්ධවයි.</u>

බස්නාහිර පළාත් සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ විශේෂ පද්ධති 18 පමණ පවතින අතර, එම පද්ධති නඩත්තු කළමනාකරණ ඒකකයේ නිලධාරීන් විසින් විධිමත්ව පවත්වාගෙන යනු ලබයි.

02. එහෙත් බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුල උත්සව හා වැඩසටහන් පවත්වන අවස්ථාවලදී මෙම පරිශ්‍රය තුල සවිකර ඇති උපාංග හා උපකරණවලට අලාභ හානි වී ඇති බව මා වෙත වාර්තා වී ඇත. සමහර අවස්ථාවලදී අදාළ නිලධාරීන් හට කිසිදු දැනුම්දීමකින් තොරව යම් යම් පුද්ගලයන් විසින් එම පද්ධති පිළිබඳව ක්‍රියාකරන බවට වාර්තා වී ඇත.

03. බිම් මහලේ පැවැත්වෙන ප්‍රදර්ශන සඳහා ස්වංක්‍රීයව ක්‍රියාත්මක වන දොරවල් (Sliding Doors) ක්‍රියාවිරහිත කර තැබීම එක් උදාහරණයක් ලෙස දැක්විය හැක. මෙම දොරවල් අක්‍රීය කරන්නේ නම් එය විධිමත් ආකාරයට කළ යුතු අතර, එසේ නොවුනහොත් එම දොරට සම්බන්ධ ඉලෙක්ට්‍රොනික් පද්ධතියට හෝ එයට අදාළ මෝටරයට හානි සිදුවිය හැකි අතර, ඒවා නිවැරදි කිරීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවේ.

04. එමෙන්ම VIP පිවිසුමේ ඇති දොරවල් (Sensor) තුනම දෙපස නොයෙකුත් ප්‍රදර්ශන භාණ්ඩ තැබීම හේතුවෙන් ඒවා නිරන්තරයෙන් මෙම දොරවල්වල Sensor එක මඟින් සංවේදනය (Sense) කරගැනීම නිසා දැනටමත් මෙම දොරවල් නිසිපරිදි ක්‍රියා නොකරන බව වාර්තා වී ඇත. ප්‍රදර්ශන පැවැත්වෙන අවස්ථාවේදී එම වීදුරු දොරවල අසල වානේ වලින් නිම වූ නොයෙකුත් එල්ලුම් (Hangers) එම වීදුරු දොරවලට ඉතා අනාරක්ෂිත ලෙස තබා ඇති බවද දක්නට ලැබුන බවට ද වාර්තා වී ඇත.

05. තවද, මෙම ප්‍රදර්ශන පවතින කාලය තුලම VIP පිවිසුමේහි Sensor දොරවල් දෙකක් නඩත්තු කළමනාකරණ ඒකකයේ අනුදැනුමකින් තොරව සම්පූර්ණයෙන් විවෘතව තබා ඇති අතර, මෙම හේතුව නිසා එම ස්ථානයෙහි වායුසමීකරණ පහසුකම අනිසි ලෙස භාවිතාවන බව ද වාර්ථා වී ඇති අතර, අදාළ ප්‍රදර්ශනය සඳහා වන විදුලි උපකරණ මෙම ගොඩනැගිල්ලේ විදුලි පද්ධතියට සම්බන්ධ කිරීමේදී කිහිපවරක් විදුලි විසන්ධිවීම් සිදුවී ඇත.

06. මෙලෙස විවිධ පුද්ගලයින් විසින් මෙම පද්ධති ක්‍රියාකිරීම මඟින් මෙම පද්ධතිවලට විශාල හානියක් සිදු වේ. මෙම ගොඩනැගිල්ලේ ස්ථාපිත භාණ්ඩ, උපකරණ, උපාංග, අයිතමයන් හා සවිකිරීම් කුමන තත්ත්වයක් යටතේ දී වත් පවත්නා තත්ත්වයෙන් වෙනස් කිරීම් සිදු නොවීමට වගබලාගත යුතු අතර, ආයතනිකමය උත්සව හා වැඩසටහන් පවත්නා අවස්ථාවලදී යම් වෙනස්කිරීම් සිදුකිරීමට සිදුවේ නම් මූලස්ථාන ඉංජිනේරුගේ පූර්ව එකඟතාවය අනිවාර්යයෙන්ම ලබාගත යුතු බව තරයේ අවධාරණය කරමි.

07. මේ පිළිබඳව ඔබගේ කාර්යය මණ්ඩලය සහ ඔබ යටතේ පවතින ආයතන ද දැනුවත් කරන ලෙස සහ මෙවැනි සිදුවීම් ඉදිරියේදී සිදු නොවීමට සියළුදෙනා වග බලාගත යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දුරකථන : 0112-092600
ෆැක්ස් : 0112-092601
විද්‍යුත් ලිපිනය : chiefsecretary@wpc.gov.lk

පිටපත : අධ්‍යක්ෂ, වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය. - ඉහත උපදෙස් වලට අනුකූලව කටයුතු සිදු නොකරන අවස්ථාවලදී නි.ප්‍ර.ලේ.(පාලන), නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) වෙත වහාම වාර්තා කිරීම සඳහා.